# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,100 — 1935ක්වූ ජනවාරි මස 18 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.— හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Badulla No. 150.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1935ක්වූ මාර්තු මස 5වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 10.30ට බදුල්ල කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අයුරකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල පලාතේ වෙල්අස්ස, බුත්තල සහ උඹුකිඳ කොටසවල පිහිටා තිබෙන බිම්කැබලි 10ක්.

මුල් ගම් සිතියමේ නො. P. P. 1,813. ගම—වෙල්අස්ස පලාත, වැගම්පත්තුකෝරලේ, කනවැගල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 1260A | මිගහලන්ද .. | — .. | ආණ්ඩුව, කනවැගල්ලේ ඇම්. ඇන්. මීරා විසින් අයුත්තේ බුත්ති විඳිති | අවුරුදු 4ක් වයසැති වතුන, ගොඩනැගිල්ලක්ද තිබේ | 0 0 5 | 50 |
| 1260B | එම .. | — .. | ආණ්ඩුව, කනවැගල්ලේ ආර්. පප්පන් විසින් අයුත්තේ බුත්ති විඳිති | එම .. | 0 0 8 | 50 |
| 1260D | එම .. | — .. | ආණ්ඩුව, කනවැගල්ලේ කානා සුප්පයියා විසින් අයුත්තේ බුත්ති විඳිති | අවුරුදු 5ක් වයසැති වතුන, ගොඩනැගිල්ලක්ද තිබේ | 0 0 38 | 50 |
| 1260E | එම .. | — .. | ආණ්ඩුව, කනවැගල්ලේ කානා පන්නලන්ගු විසින් අයුත්තේ බුත්ති විඳිති | එම .. | 0 0 34 | 50 |
| 1260F | එම .. | — .. | ආණ්ඩුව, කනවැගල්ලේ ඇස්. වඩුවේලු විසින් අයුත්තේ බුත්තිවිඳිති | — .. | 0 1 24 | 50 |

මුල්ගම් සිතියමේ නො. P. P. A 68. ගම—වෙල්අස්සපලාත, වැගම්පත්තුකෝරලේ, කනවැගල්ල.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | ගෝනන්කැලේ | කනවැගල්ලේ ඇම්. කදිරවේල් | ආණ්ඩුව .. .. | අලුත එලිකරපු ඉඩමක් | 2 0 0 | 50 |
| 2 | එම .. | — .. | එම .. .. | — .. | 0 0 18 | —* |

අන්තිම ගම් සිතියමේ නො. F. V. P. 123. ගම—වෙල්අස්සපලාත, මැදගම්පත්තුකෝරලේ, අයිවෙල.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2B1 | සියඹලාගහ කුඹුර | — .. | ආණ්ඩුව, හන්නපුරවේ වවුන්ආරච්චි වන ඒ. ඇම්. කලුබන්ඩා විසින් අයුත්තේ බුත්ති විඳිති | කුඹුර .. | 0 1 2 | 45 |

මුල්ගම් සිතියමේ නො. P. P. A 28. ගම—බුත්තලපලාත, බුත්තල වැදිරටකෝරලේ, ලොල්ලේගම.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 | දෙඹගහවෙල වත්ත | — .. | ආණ්ඩුව, දෙඹගහවෙල ඒ. ඇම්. ඒ. කාරිම් සහ ඒ. ඇම්. අලියාර් ලෙබ්බේ විසින් අයුත්තේ බුත්ති විඳිති | ඉඩමේ කෙසෙල්, දෙහි, දෙඩන්ගස් වවාද, ගොඩනැගිල්ලක්ද තිබේ | 0 0 37 | 1,535 |

15——J. N. 43502—128 (1/35)
S 1

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නෝ. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිළ, රු. |
|---|---|---|---|---|---|---|
| | මුල්ගම් සිතියමේ නො. P. P. 2,864. ගම—උඩුකිඳපලාත, උඩපලාතකෝරලේ, එරබද්දේගම. | | | | | |
| 3 | හෙට්ටිගෙදර දෑව * | — | ආණ්ඩුව, එරබද්දේ ඇන්. ඇම්. ප්‍රංචිරාල විසින් අයුත්තේ භුක්ති විඳිති | ඉඩමේ තේ වවා තිබේ | 0 0 3 | 450 |

* මෙම ඉඩම විකිණීමට නොවේ (නොවිකුණා ඉතුරුකිරීමට).

ඉහතකී ඉඩම් ගැන වැඩිදුර කාරණා ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1935ක්වූ ජනවාරි මස 16වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ 7වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දකුණු පලාතේ මාතර දිසාවේ වැලිගම්කෝරලයේ මිරිස්සේ පොදු ලිඳක් තැනවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

මුල් සිතියමේ නො. A. 241. ගම—මිරිස්ස දකුණ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පොකුණබඩවත්ත නොහොත් මෙසත්‍රි වත්ත සම්මිටම්බිගෙයි සිමන් පදිංචි වත්ත | .. | මිරිස්සේ පදිංචි, (1) බෝර්ලි විරසූරිය සහ (2) කුතිහැන්නැදිගෙයි ජුවානිස් සිල්වා | 0 0 3·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ පෙබරවාරි මස 28වෙනි දින පෙරවරු 10.30ක් කාලයට මාතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ ජනවාරි මස 9වෙනි දින මාතර කච්චේරියේදීය.

සී. ජේ. බී. ලැන්ක්‍රි,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ලන්දේබොක්කේ ඇලේ මාගීය වෙනස්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

නො. 2ක් අන්තිම ගම් සිතියමේ නො. 7වෙනි අතිරේකය. ගම—බදුල්ල දිස්ත්‍රික්කේ කුඹල්වෙලකෝරලේ ගොටුවලගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| SA1 | උඩඅරාවේහේන | පතන, ඇලක්තිබේ .. | වීරසිංහමුදියන්සෙලාගේ උක්කුබංඩා, එම පුංචිමැණිකා, එම කුමා, සියල්ලෝම ගොටුවල පදිංචි | 0 0 16·5 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ අප්‍රේල් මස 2වෙනි දින පස්වරු 2ක් කාලයට බදුල්ල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගනනත් ඊට ඇත්තාවූ තමූන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1935ක්වූ ජනවාරි මස 12වෙනි දින බදුල්ල කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඒ. ද සිල්වා,
ඌවේ ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

---

## 1920සේ නොම්මර 11 දරණ ප්‍රදේශික ආණ්ඩු ව්‍යවස්ථාව.

වැලිගම නගරබද පලාත් ආණ්ඩුසභාවේ නො. 5 (කප්පරතොට) කොට්ඨාශයට උපදේශකයෙක් තේරීම.

වැලිගම නගරබද පලාත් ආණ්ඩුසභාවේ නො. 5 (කප්පරතොට) ඡන්දදායක කොට්ඨාශයට තෝරාගත්තාලද උපදේශක වරයා වන ඒ. ඇල්. ජයසූරිය මහතා වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 10වෙනි දිනට එකී කොට්ඨාශයේ උපදේශක තනතුරෙන් ඉල්ලා අස්වන ලදින් වර්ෂ 1920සේ 11වෙනි ආඥාපණතේ 33 (2) වෙනි වගන්තිය යටතේ එකී වැලිගම නගරබද පලාත් ආණ්ඩුසභාවේ නො. 5 ඡන්දදායක කොට්ඨාශයට (කප්පරතොට) ඉහතකී පුරප්පාඩුවට උපදේශකවරයෙක් තේරීම සඳහා වර්ෂ 1935ක්වූ පෙබරවාරි මස 19වෙනි අඟහරුවාදා පවත්වන්ට අදහස්කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ඉදිරිපත් වෙන සෑම කැනැත්තෙක්ම ලියා නම්කරනු ලැබිය යුතුයි. එකී ඡන්දදායක කොට්ඨාශයේ ඡන්දදායක ලේඛණයේ නම් පෙනෙන දෙදෙනෙක් නාම පත්‍රයට අත්සන් තබා තිබෙන්ට ඕනෑය. මෙකී නාමපත්‍ර වැලිගම නගරබද පලාත් ආණ්ඩුසභාවේ කාර්‍යාලයේදී මේ සඳහා නියමකරනලද දිනය වන 1935 පෙබරවාරි මස 19වෙනි අඟහරුවාදා පෙරවරු 11ට හෝ ඊට ප්‍රථම දෙන්ට ඕනෑය.

3. ඉහතකී කොට්ඨාශය වෙනුවෙන් එක්කෙනෙකුට වැඩි ගණනක් නම් කරන්ට යෙදුනහොත් වර්ෂ 1935 මාර්තු මස 2වෙනි සෙනසුරාදා වැලිගම ගම්සභා කොමිටි කන්තෝරුවේ ඡන්දදායක සභාශාලාවේදී ඡන්දය විමසනු ලැබේ.

4. ඡන්දය විමසීම පෙරවරු 8.30ට ආරම්භව දවල් 12.30ට සමාප්ත වන්නේය.

සී. ජේ. බී. ලැන්ක්‍රි,
මාතර උප දිසාපතිතුමා වෙනුවට.

වර්ෂ 1935 ජනවාරි මස 15වෙනි දින මාතර කච්චේරියේදීය.

---

වැලිගම පලාත් ආණ්ඩු සභාව—අතුරු තේරීම.

නො. 1 දරණ කොට්ඨාශයට උපදේශක මහතෙකු තේරීම.

වර්ෂ 1935 දෙසැම්බර් මස 31වෙනි දිනට අවසානවන කාල සීමාව දක්වා වැලිගම පලාත් ආණ්ඩු සභාවේ නො. 1 දරණ කොට්ඨාශයේ උපදේශකතැන හැටියට පටබැඳිගේ ඒබ්‍රහම් ද සිල්වා මහතා තෝරා පත්කරන්ට යෙදුන බව වර්ෂ 1920 නො. 11 දරණ පලාත් ආණ්ඩු සභා ආඥාපණතේ 31 (2) වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

සී. ජේ. බී. ලැන්ක්‍රි,
මාතර උප දිසාපතිතුමා වෙනුවට.

වැලිගම, ජනවාරි 11, 1935.

## සුප්‍රිම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන අඥාවක බලය කරණකොටගෙන මෙසින් ප්‍රකාශ කරන්නේනම් ජපනය, මන්නාර් සහ මුල්ලේතිව් දිසාවල ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1935ක්වූ පෙබරවාරි මස 11වෙනි දින පෙරවරු 11 පැය පටන් ජපනයේ තිබෙන දිස්ත්‍රික් නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින හැමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එසින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙසින් සැම දෙනාටම දන්වන්නෙමි.

අත්සන්කලේ, ඇස්. දෙරෛඅප්පා,
පිස්කල් වෙනුවට.

වර්ෂ 1935ක්වූ ජනවාරි මස 9වෙනි දින
ජපනය පිස්කල් කන්තෝරුවේදීය.

## ලංකා සේවිංස් බැංකුවේ පොලී පිළිබඳ දැන්වීම.

මෙම බැංකුවේ මුදල් තැන්පත්කරන්නන්ට 3වෙනි නියොගය යටතේ 1935හේ අවුරුද්දට ගෙවියයුතු පොලියේ ප්‍රමාණය රුපියල් 1,000ට වැඩිනොවන ගණන්වලට සියයට 3½ක් සහ රුපියල් 1,000න් වැඩි ගණන්වලට සියයට 3ක් බව එම බැංකුවේ ඩිරැක්ටර්වරුන් විසින් මෙසින් දන්වනු ලැබේ.

හැන්රී ඒ. හේමර්,
සෙක්‍රතාරිස් තැන.

වර්ෂ 1935ක්වූ ජනවාරි මස 3වෙනි දින
කොළඹ ලංකා සේවිංස් බැංකුවේදීය.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.